# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,934 - 2015 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2015.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1342 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1353 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1341 - B 80989— 5352 (2015/09)
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසිකව) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | රියදුරු | 01 | රු.12,470-10x130-10x145-10x160-12x170-රු.18,860 (PL 3-2006A) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්වීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්ව තිබිය යුතුය.) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතා සහතිකය හා වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.) අවම උස අඩි 05ක් විය යුතුය. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය;
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය;
(iii) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.) ;
(iv) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය;
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය;
(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය.
(2) පත්වීමේ දින සිට අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(3) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(4) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
(2) අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුයි :-

(1) උප්පැන්න සහතිකය ;
(2) අධ්‍යාපන සහතික;
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
(4) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය;
(5) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
(6) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික;
(7) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම ඃ*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම්කරන තනතුර අදාල කවරයේ වම්පස ලියා 2015.10.16 දිනට පෙර ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනෙන් පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉඳුජිත්,
ලේකම්,
මහර ප්‍රාදේශීය සභාව.

2015ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
කඩවත,
පහළ කරගහමුණ,
මහර ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***මහර ප්‍රාදේශීය සභාව***

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................................ තනතුර සඳහා බඳවා ගැනීම

1. මුලකුරු සමග නම :———.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———.
3. ස්ථිර ලිපිනය :———.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :———.
5. උපන් දිනය :අවුරුද්ද :———. මාසය :———.දිනය :———.
   2015.10.16 දිනට වයසඃ වර්ෂ :———. මාස :———.දින :———.
6. ජාතික හැඳුනුම්පත් අංකය :———.
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ උපතින් ද /ලියාපදිංචි වීමෙන් ද? :———.
8. (i) අධ්‍යාපන සුදුසුකම් ඃ

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *5.* | |
| *2.* | | *6.* | |
| *3.* | | *7.* | |
| *4.* | | *8.* | |

   (ii) වෙනත් සුදුසුකම් ඃ ———.
9. වෘත්තීයමය සුදුසුකම් ඃ ———.
10. සේවා පළපුරුද්ද :———.
   (i) දැනට දරන තනතුර :———.
   (ii) එම තනතුරට පත්වූ දිනය :———.
   (iii) එම තනතුරේ සේවා කාලය :———.
   (iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු :———.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

**දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන .................................. මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ ................................. වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිලමුද්‍රාව)

දිනය :———.

09-607

## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම - මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම්* | | *වෙනත්* | *වැටුප් පරිමාණය සුදුසුකම්* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|---|---|
| | | | *අභ්‍යන්තර* | *බාහිර* | | | |
| 01 | ආදායම් පරීක්ෂක III | 01 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහක් (05) එක්වර සමත් වී තිබිය යුතුය.) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | අභ්‍යන්තර අයදුම්කරුවන් පළපුරුද්ද අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය. (බාහිර අයදුම්කරුවන්) පළපුරුද්ද අදාළ නැත. | (MN-1-2006A) රු. 13,120 - 10 x 145 - 11 x170 -10 x 240 - 10 x 320 - රු. 22,040. 1 වන කාර්යක්ෂමතා කඩඉම 111 ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගතවීමට පෙර (ලිඛිත පරීක්ෂණය) | සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය විය යුතු අතර, එම පරීක්ෂණයේ දී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.<br><br>*ලිඛිත පරීක්ෂණයේ විෂයයන් :*<br><br>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය-<br><br>උපරිම ලකුණු ප්‍රමාණය 100. සමත් ලකුණු ප්‍රමාණය 40% - සාමාන්‍ය දැනීම උපරිම ලකුණු ප්‍රමාණය 40% පුරප්පාඩු පිරවීමට පෙර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. (මෙහිදී ලකුණු ලබාදෙනු නොලැබේ.) |

*02. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය;
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 30ට නොවැඩි විය යුතුය.දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ;
(iii) බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය ;
(iv) පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය;
(v) යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(vii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතු ය.
(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
(ix) පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්, ආදේශක, ව්‍යාපෘති, කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාල සීමාවේදී බස්නාහිර පළාතේ මම තනතුරුවලට, අදළ නව බඳවාගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01ක වැඩ බැලීමේ කාලයකට යටත්වේ.
(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ මුදල් රෙගුලාසි වලටද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ පාලින්දනුවර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා තිබිය යුතු යః-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත,
(vi) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (මින් 1ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.)
(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය,
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

*05. අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර, ඉල්ලුම්කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා අංක 04 ඡේදයේ දක්වා ඇති ලියකියවිලි ද සමඟින් 2015.09.30 වැනි දින හෝ එදිනට පෙර ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. ඩී. සෝමලතා,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***පාලින්දනුවර ප්‍රාදේශීය සභාව***

............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

01. (i) මුලකුරු සමග නම :———.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
02. ස්ථිර ලිපිනය :———.
03. උපන් දිනය :———.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :———.
05. ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |
06. දුරකථන අංකය :———.
07. විවාහක/අවිවාහක බව :———.

8. අධ්‍යාපන සුදුසුකම් ඃ

8.1 අයදුම්කරුවන් අවසන්වරට සමත් වූ පන්තිය ඃ ———.

8.2 අ.පො.ස. (සා.පෙ.) විභාගය ඃ

(i) වර්ෂය ඃ ———. මාසයඃ ———.

(ii) විභාග අංකය ඃ ———.

(iii) ප්‍රතිඵලඃ ———.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *5.* | |
| *2.* | | *6.* | |
| *3.* | | *7.* | |
| *4.* | | *8.* | |

8.3 අ.පො.ස. (උ.පෙ.) විභාගය ඃ

(i) වර්ෂය ඃ ———. මාසයඃ ———.

(ii) විභාග අංකය ඃ ———.

(iii) ප්‍රතිඵලඃ ———.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| *1.* | |
| *2.* | |
| *3.* | |
| *4.* | |

9. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඃ ———.

10. වෙනත් සුදුසුකම් :———.

11. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද /නැතිද යන වග :———.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටද යටත්වන බව ද මම දනිමි.

———,

අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

09-498

---

**කොලොන්නාව නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

කොළොන්නාව නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාළ සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොළොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් කොළොන්නාව නගර සභාවේ, සේවයේ නියුතු අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| 1 | පෙදරේරු III | 2 | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි. සහ ;<br>(ආ) මෙම තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි ; සහ<br>(ආ) මෙම තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම ; හෝ<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA ) වෘත්තියට අදාළව එක් වසරකට | රු. 12,470 - 10 x 130- 10 x 145 - 10 x160 - 12 x 170 - රු. 18,860 4 වන (රු. 12,860) වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් න්‍යායාත්මක දැනුම පරීක්ෂාව ලකුණු 100. .සමත් ලකුණු ප්‍රමාණය 40%. ප්‍රායෝගික පරීක්ෂණය ලකුණු 100. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. | | |
| 2 | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක III | 1 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන් පහ (05) ක් එක්වර සමත් වී තිබිය යුතුයි. | (අ) සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | අභ්‍යන්තර අයදුම්කරුවන් කොලොන්නාව නගර සභාවේ PL -1 හා PL- 2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය. | රු. 13,120 - 10 x 145 - 11 x 170- 10 x 240 - 10 x 320 - රු. 22,040 වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත විභාගයක් මඟින්<br>විවෘත විභාගය :-<br>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100<br>සමත් ලකුණු ප්‍රමාණය 40%<br>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය ලකුණු 100<br>සමත් ලකුණු ප්‍රමාණය 40%<br>සීමිත විභාගය :<br>සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100<br>සමත් ලකුණු ප්‍රමාණය 40%<br>ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම ලකුණු 100<br>සමත් ලකුණු ප්‍රමාණය 40% |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| 3 | සෞඛ්‍ය කම්කරු III | 3 | - | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. | අදාළ නොවේ. | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 වසර 3 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| 4 | මෝටර් කාර්මික III | 1 | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයනය පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි ; සහ<br><br>ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි ; සහ<br><br>(ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම ; හෝ<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 4 වන රු. 12,860 වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්.<br><br>න්‍යායාත්මක දැනුම පරීක්ෂාව ලකුණු 100.<br><br>සමත් ලකුණු ප්‍රමාණය 40%.<br><br>ප්‍රායෝගික පරීක්ෂණය ලකුණු 100. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. | | |
| 5 | කාර්යාල කාර්‍යය සහායක II | 1 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත්විය යුතුවේ. | අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. | (අ) කාර්යාල සේවක සේවයේ තනතුරක 111 පංතියේ/ ශ්‍රේණියේ තනතුරේ ස්ථිර කර තිබීම.<br>(ආ) කාර්යාල සේවක සේවයේ 111 පංතියේ/ ශ්‍රේණියේ වසර 5ක සක්‍රිය සේවා කාලයක් සපුරා තිබීම.<br>(ඇ) කාර්යාල සේවක සේවයේ 111 පංතියට/ ශ්‍රේණියට අදල කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම<br>(ඈ) උසස්වීම ලැබීමට නියමිත දිනට සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම. | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 මෙම වැටුප් පරිමාණයේ 12 වන පියවර (රු.13,060) ආරම්භක වැටුප් පියවර වේ. රු. 13,840ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | වාචික පරීක්ෂණයක් මගින් කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනීම ලකුණු 100, තනතුරට අදල රාජකාරී පිළිබඳ ප්‍රායෝගික දැනීම ලකුණු 100. මෙම කොටස් දෙකින් එක් එක් කොටස සඳහා ලකුණු 50%ක් බැගින් ලබාගත යුතු අතර කොටස් දෙකටම ලබාගත යුතු ලකුණුවල සාමාන්‍ය 60%ක් විය යුතුය. |

2. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය ;
(ii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය ;
(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය ;
(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 18 ත් 45 ත් අතර විය යුතුය. වැඩ/ ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා අවු 30 ට නොවැඩි විය යුතුය ; (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
(v) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය ;
(vi) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ ;
(vii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය ;
(viii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතු ය ;
(ix) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය ;
(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොලොන්නාව නගර සභාවේ ලේකම් සතු ය.

3. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. ස්ථිර සේවකයින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ ;
(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.
(iv) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝග වලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද, අනුකූලව කටයුතු කළ යුතු ය.

4. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ 4 ප්‍රමාණයේ) අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2015.10.09 දිනට පෙර ලේකම්, කොලොන්නාව නගර සභාව, කොලොන්නාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල පිටපත් එවිය යුතු යඃ-

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ;
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vii) පොලිස් වාර්තාව.

5. පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට, ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට කැඳ වූ පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතු ය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කොලොන්නාව නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

ගීතානි ඩී. ලොකුවැල්ල,
ලේකම්,
කොලොන්නාව නගර සභාව.

2015 ක්වූ සැප්තැම්බර් මස 09 වැනි දින,
කොලොන්නාව නගර සභාවේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළොන්නාව නගර සභාවේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම*

1. *(අ)* මුල'කුරු සමග නම : ————— ;
   *(ආ)* මුල'කුරුවලින් හැඳින්වෙන නම් : ————— ;
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ————— ;
3. ස්ථිර ලිපිනය : ————— ;
4. (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : ————— ;
   (ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? : ————— ;
5. ජාතික හැඳුනුම්පත් අංකය : ————— ;
6. ස්ත්‍රී/පුරුෂ භාවය : ————— ;
7. විවාහක/අවිවාහක තත්ත්වය : ————— ;
8. දුරකථන අංකය : ————— ;
9. උපන් දිනය :
   වර්ෂය : ————— ; මාසය : ————— ; දිනය : ————— ;
10. 2015.10.09 දිනට වයස :
    වර්ෂ : ————— ; මාස : ————— ; දින : ————— ;
11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) : ————— ;

11.1 අයදුම්කරු අවසන් වරට සමත් වූ පංතිය : ————— ;
11..2 අ.පො.ස. (සා. පෙළ) විභාගය :
වර්ෂය : ————— ; මාසය : ————— ;
විභාග අංකය : ————— ;
ප්‍රතිඵල :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

11..3 අ.පො.ස. (උ. පෙළ) විභාගය
වර්ෂය : ————— ; මාසය : ————— ;
විභාග අංකය : ————— ;
ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද : ————— ;
13. වෙනත් සුදුසුකම් : ————— ;
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?/නැත් ද යන වග : ————— ;

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

............................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ....................................................

09-638

**මාතර මහ නගර සභාව**

2015.09.11 වැනි දින අංක 1932 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටස - පළාත් පාලනය හි තනතුරු ඇබෑර්තු ඇතුළත් (පිටු අංක 1246 හා 1247) අංක 09-245 දැන්වීමට අදාළ අයදුම්පත මාතර මහ නගර සභාවෙන් ලබාගත හැකි බව කරුණාවෙන් සලකන්න.

ටී. එච්. ආර්. ලක්මාලි,
නියෝජ්‍ය නාගරික කොමසාරිස්,
මහ නගර සභාව - මාතර.

2015 සැප්තැම්බර් මස 14 වැනි දින,
මහ නගර සභාව - මාතර.

09-688

---

# පළාත් පාලන නිවේදන

## කුරුණෑගල මහ නගර සභාව

කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාර සඳහා මහ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2016 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන වෙළඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම සඳහා

කුරුණෑගල මහ නගර සභාව විසින් වර්ෂ 2015 අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම.ස ග 05(01) දරන අංක යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල මහ නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද මහ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගත යුතු සෑම අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාරයක්ම පවත්වාගෙන යාමේ ස්ථානය වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නාගරික කොමසාරිස්වරයාගෙන් වලංගු බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ ලබාගත් වලංගු බලපත්‍රයක් නොමැතිව ඒ ඒ යම්කිසි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වරදක් බවත් මෙයින් තවදුරටත් නිවේදනය කරනු ලැබේ. එවැනි යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සෑම බලපත්‍රයක් සඳහාම 2016 වර්ෂය සඳහා පහත සඳහන් යෝජනාවේ ආකාරයට ගාස්තුවක් කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුරාධ ගාමිණී පෙරමුණගේ,
නගරාධිපති,
කුරුණෑගල මහ නගර සභාව.

2015 අගෝස්තු මස 28 වැනි දින,
කුරුණෑගල මහ නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"කුරුණෑගල මහ නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989.01.20 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති මහ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සඳහන් කිසියම් අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාරයක් 2016 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා කුරුණෑගල මහ නගර සභාවේ නාගරික කොමසාරිස්ගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන්ම, එකී ව්‍යාපාරය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම 11 වන උපලේඛනයේ 02 වන කොටසේ I වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 247 අ සහ ආ වන වගන්තිවලින් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් කුරුණෑගල මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා යෝජනා කරන්නේය."

**I වැනි උපලේඛනය**

*1 වැනි කොටස :*
අන්තරාදායක ව්‍යාපාර :

1. කොන්ඩා කැපීමේ සහ සැකසීමේ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම
2. රූපලාවන්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම
3. ලොන්ඩරියක් පවත්වාගෙන යාම
4. හෝටලයක් පවත්වාගෙන යාම
5. නවාතැන් පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙනයාම
6. බත් කඩයක් හෝ ආපන ශාලාවක් හෝ තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම
7. කිරි පට්ටි හා කිරි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

8. බේකරියක් පවත්වාගෙන යාම
9. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
10. සිසිල්බීම නිෂ්පාදනය සහ අලෙවි කිරීම
11. අයිස් නිෂ්පාදනය සහ අලෙවි කිරීම
12. මිනිරන් ගබඩා කිරීම, මිනිරන් සකස් කිරීම සහ වර්ග කිරීම
13. කාබනික සහ රසායනික පොහොර නිෂ්පාදනය, ගබඩා කිරීම සහ අලෙවිය
14. කලුගල් සහ කබොක් කැඩීම සහ විකිණීම
15. බොරලු හැරීම සහ අලෙවිය
16. තලාතු මිනිරන් සකස් කිරීම
17. පශු ගිලන්හලක් පවත්වාගෙන යාම
18. පොහොර නිෂ්පාදනය, ගබඩාව සහ අලෙවිය
19. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය
20. හුණු ගබඩාකොට තැබීම
21. නරක්වනසුළු ආහාර ද්‍රව්‍ය සිල්ලර සහ තොග අලෙවිය
22. බොම්බයි ලූණු සහ අර්තාපල් ගබඩා කිරීම සහ අලෙවිය
23. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි ගෙන්දගම් දුම්ගසා සකස් කිරීම
24. පරණ ලෝහ ගබඩා කිරීම
25. සිමෙන්ති හොණ්ඩර 25කට වැඩියෙන් ගබඩා කිරීම
26. ගම් වර්ග නිෂ්පාදනය සහ අලෙවිය
27. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය
28. රෙදි පවිත්‍ර කිරීමේ කාරක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය
29. බැටරි පුරවනු ලබන්නා වූ හෝ බැටරි ගබඩා කර තබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
30. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
31. හිස් බෝතල් 100කට වැඩියෙන් ගබඩා කර තැබීම
32. කුරුඳු පොතු ගබඩා කිරීම සහ අලෙවිය
33. කොකෝවා ගබඩාව සහ අලෙවිය
34. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තැබීම
35. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
36. පිටි හෝ කුළුබඩු ඇඹරීම හා අලෙවිය
37. පුන්නක්කු හෝ වෙනත් සත්ත්ව ආහාර ගබඩාව සහ අලෙවිය
38. රබර් භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය
39. මෝර වරල් සකස් කිරීම, අලෙවිය සහ ගබඩාව
40. පොලිතීන් සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, ගබඩාව සහ අලෙවිය
41. ඇසිඩ් ගැලුම් 05කට වැඩියෙන් ගබඩා කර තැබීම
42. කපුරු නිෂ්පාදනය සහ අලෙවිය
43. සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය සහ අලෙවිය
44. වාෂ්ප ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව ඉරීම
45. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
46. ගිණිපෙට්ටි නිෂ්පාදනය සහ අලෙවිය
47. පොල්තෙල් සිඳීම, ගබඩා කිරීම සහ අලෙවිය
48. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩාව සහ අලෙවිය
49. ඇසිටලීන නිෂ්පාදනය සහ අලෙවිය
50. සිගරට් නිෂ්පාදනය සහ අලෙවිය
51. ටයර් සහ ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. තීන්ත හෝ වාර්නිස් හොණ්ඩර 05කට වැඩියෙන් ගබඩා කර තැබීම
53. කොහු නිෂ්පාදනය සහ අලෙවිය
54. රස කැවිලි නිෂ්පාදනය සහ අලෙවිය
55. ලී පෙට්ටි සෑදීම
56. ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩ කරනු ලබන්නා වූ ද මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
57. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නාවූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
58. ඩිජිටල් හෝ අතින් හෝ පා පොලුවලින් හෝ යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
59. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර 545කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
60. ගෙන්දගම් සහ ගෙන්දගම් කුඩු කිලෝ ග්‍රෑම් 50 වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම.
61. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය
62. 100කට අධික ප්‍රමාණයක් පතරොම් ගබඩා කර තැබීම
63. අලුත් ටයර් ටියුබ් ගබඩා කර තැබීම
64. පාවිච්චි කළ කඩදාසි කිලෝ ග්‍රෑම් 250කට වැඩි ප්‍රමානයක් ගබඩා කර තැබීම
65. යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
66. ඇඟලුම් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
67. බතික් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
68. ඩ්‍රයි ක්ලීනින් කරන ආයතනයක් පවත්වාගෙන යාම
69. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන ඉලෙක්ට්‍රික් රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
70. ගල් අඟුරු, ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම
71. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය සහ අලෙවිය
72. අශුද්ධ ලෝහ ගබඩා කිරීම
73. ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය
74. කිලෝ ග්‍රෑම් 02කට වැඩි ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම
75. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය කිරීම
76. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
77. ශීතකරණ අලුත්වැඩියා කිරීම, රිකන්ඩිෂන් කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
78. මෝටර් කාර් එකලස් කිරීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම
79. ස්කූටර් සහ මෝටර් සයිකල් එකලස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
80. පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
81. වී/හාල්/ කුළුබඩු ඇතුලු අනෙකුත් ධාන්‍ය වර්ග ඇඹරුම්හල් පවත්වාගෙන යාම
82. සුරතල් මසුන් ඇති කිරීම සහ අලෙවිය
83. මත්පැන්හලක් හෝ ස්කාගාරයක් පවත්වාගෙන යාම
84. ව්‍යායාම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
85. සිසිල්බීම අලෙවිය
86. සිංහල බෙහෙත් ගබඩා කිරීම සහ අලෙවිය
87. ඉංග්‍රීසි බෙහෙත් ගබඩා කිරීම සහ අලෙවිය
88. ධාන්‍ය ගබඩා කිරීම සහ අලෙවිය
89. සෝයා අයිස්ක්‍රීම් හෝ වෙනත් අයිස් ක්‍රීම් වර්ග නිෂ්පාදනය සහ අලෙවිය
90. යෝගට් හෝ කිරි ආශ්‍රිත වෙනත් ආහාර හෝ රසකැවිලි නිෂ්පාදනය සහ අලෙවිය
91. එළවලු සහ පලතුරු ගබඩාව සහ අලෙවිය

92. සනීපාරක්ෂක භාණ්ඩ ගබඩාව සහ අලෙවිය
93. පානීය ජල බෝතල් ගබඩා කිරීම සහ අලෙවි කිරීම
94. පෞද්ගලික රෝහලක් හෝ රෝගීන් වැනල් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
95. කොප්පරා නිෂ්පාදනය, ගබඩා කිරීම සහ අලෙවි කිරීම
96. වෙල්ඩිං වැපෙලක් පවත්වාගෙන යාම
97. මෝටර් වාහන, යතුරු පැදි, පාපැදි, තණකොළ කපන යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථාන හෝ ස්ථානයක් පවත්වාගෙන යාම
98. දුම්කොළ ගබඩාව සහ අලෙවිය
99. වයින් ස්ප්‍රීතු ගබඩාව සහ අලෙවිය
100. ඡායාරූප ශාලාවක්, ඡායාරූප මුද්‍රණ කටයුතු කරන රසායනාගාරයක් යන ස්ථාන හෝ ස්ථානයක් පවත්වාගෙන යාම
101. පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
102. පෞද්ගලික උපකාරක පංති හෝ වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්වීමේ ආයතනයක් පැවැත්වීම
103. පුද්ගලික පෙර පාසලක් පවත්වාගෙන යාම
104. පුද්ගලික ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම
105. විශ්ව විද්‍යාල හා අනුබද්ධිත උපාධි, ඩිප්ලෝමා ආදිය පිරිනමන පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
106. සංගීත, චිත්‍ර, නැටුම් සහ වෙනත් ලලිත කලා අධ්‍යාපන ආයතනයක් හෝ කලායතනයක් පවත්වාගෙන යාම
107. පුද්ගලික හෙද අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
108. පුද්ගලික දන්ත වෛද්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. වෛද්‍ය පරීක්ෂණ වාර්තා (මෙඩිකල්) නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
110. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. රෙදි පවිත්‍ර කාරක නිෂ්පාදන සහ අලෙවිය
112. ෆයිබර් වැඩපලක් පවත්වාගෙන යාම
113. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
114. වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115. එළවළු/පළතුරු වගා කිරීමේ ගොවිපලක් පවත්වාගෙන යාම
116. කුකුළු, කළුකුන්, තාරා සහ වෙනත් සතුන්ගේ බිත්තර අලෙවි කිරීම
117. පශු වෛද්‍ය කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම හෝ සත්ත්ව රෝග සඳහා බෙහෙත් ද්‍රව්‍ය අලෙවිය
118. ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
119. ඇලුමිනියම් හෝ බෙලෙක් භාණ්ඩ නිෂ්පාදනය
120. මැණික් කැපීම සහ ඔප දැමීම
121. අශුද්ධ ලෝහ උණු කිරීම
122. ලුණු පැකට් කිරීම සහ අලෙවි කිරීම
123. රටකජු, මුරුක්කු සහ වෙනත් බයිට් වර්ග නිෂ්පාදනය සහ අලෙවි කිරීම
124. වෛද්‍ය උපකරණ අලෙවිය
125. බේකරි නිෂ්පාදන අලෙවි කිරීම
126. පේස්ට්‍රි අලෙවි කිරීම
127. පීසා නිෂ්පාදනය සහ අලෙවි කිරීම

*අප්‍රසන්න ව්‍යාපාර :*

1. සියලුම මොටර් වාහන ඇතුළු අනෙකුත් වාහන සේවා කිරීමේ (සර්විස්) ස්ථානයක් පවත්වාගෙන යාම
2. ටින්කර් සහ පේන්ට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. ඌරු, ගව, එළු, කුකුළු, තාරා, කළුකුන් ආදී සත්ත්ව ගොවිපලක් හෝ එවැනි සතුන් අලෙවි කිරීම හෝ එවැනි සතුන්ගේ මස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
4. කාබනික පොහොර නිෂ්පාදනය සහ අලෙවි කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
5. ඝාතකාගාරයක් පවත්වාගෙන යාම
6. මස් සහ මාළු විකිණීම
7. සත්ත්ව ආහාර නිෂ්පාදනය හෝ අලෙවි කිරීම
8. හම් වර්ග ගබඩාව සහ අලෙවිය
9. අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
10. සතුන්ගේ හම්, බෙටි , ඇට, කුඩු හෝ පොහොර හෝ විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් මතුවන ද්‍රව්‍ය විකිණීම හෝ ගබඩා කිරීම
11. ලියවන පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම
12. එළවලු සහ පලතුරු ගබඩා කිරීම
13. ඉවත දමන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ස්ථානයක් පවත්වාගෙන යාම
14. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අලෙවිය
15. යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන ලී මෝලක්, වඩු වැඩපලක් පවත්වාගෙන යාම
16. මිනී පෙට්ටි සෑදීම සහ ගබඩා කිරීම සහ සියලුම අවමංගල්‍ය සේවා කටයුතු කිරීම
17. වේවැල් හෝ පන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය සහ ගබඩා කිරීම
18. වලං නිෂ්පාදනය සහ ගබඩාව
19. පොල්කටු අඟුරු නිෂ්පාදනය හා ගබඩාව
20. කොප්පරා සකස් කිරීම සහ ගබඩා කිරීම
21. බීඩි නිෂ්පාදනය සහ ගබඩා කිරීම
22. වාහන සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

### 11 වැනි උපලේඛනය

| | *I වැනි තීරුව*<br>*වාර්ෂික වටිනාකම* | *II වැනි තීරුව*<br>*බලපත්‍ර ගාස්තුව*<br>*රු. ශත* |
|---|---|---|
| 01. | රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 1,000 0 |
| 02. | රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට | 2,000 0 |
| 03. | රු. 2,500 ඉක්මවන විට | 3,000 0 |

ඉහත I වැනි කොටසේ සඳහන් කර්මාන්ත අතරින් අංක 04 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 06 යටතේ සඳහන් කිසියම් ආපන ශාලාවක් හෝ අංක 05 යටතේ සඳහන් වන කිසියම් නවාතැන්පොලක් හෝ, ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක ඉහත අංක 02 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පොළ හෝ පවත්වාගෙන යනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පළෙහි 2015 වර්ෂය තුළ ලැබීම්වලින් (පිරිවැටුමෙන්) සියයට එකක් (01%), විය යුතු ය.

09-616/1

**කුරුණෑගල මහ නගර සභාව**

2016 වර්ෂය සඳහා ව්‍යාපාර විෂය බද්ද පැනවීම

කුරුණෑගල මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම.ස. 5(1) දරන අංක යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2016 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර විෂය බද්ද ඒ වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අනුරාධ ගාමිණී පෙරමුණගේ,
නගරාධිපති,
කුරුණෑගල මහ නගර සභාව.

2015 අගෝස්තු මස 28 වැනි දින,
කුරුණෑගල මහ නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 247ඇ වැනි වගන්තියෙන් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 247ආ වැනි වගන්තිය යටතේ බලත්‍රයක් ලබාගත යුතු සෑම අප්‍රසන්න හෝ අන්තරායදායක වෙළෙඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නාවූ ද හා වෘත්තියක් නොවන්නාවූ ද මෙහි පහත I වැනි උපලේඛනයේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත II උපලේඛනයේ 01 වැනි තීරයේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 02 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් ලෙස 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2016 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට කුරුණෑගල මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා යෝජනා කරන්නේය."

*01 වැනි උපලේඛනය*

1. උත්සව භාණ්ඩ කුලියට දීම.
2. ලොතරැයි ටිකට් අලෙවිය .
3. දේශීය/විදේශීය රැකියා නියෝජිත ආයතන.
4. තුරග තරග සහ සුනඛ තරග ඔට්ටු ඇල්ලීමේ ස්ථාන.
5. නියෝජිත තැපැල් කාර්යාලය .
6. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම .
7. සංඥ කුළුණු සවිකළ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. පුවත්පත් අලෙවිය.
9. රථ ගාලක් පවත්වාගෙන යාම.
10. යතුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම .
11. වෙන්දේසිකරුවන් .
12. බ්‍රෝකර්වරුන් .
13. මුදල් ආයෝජකයින් .
14. මුදල් ණයට දෙන්නන් .
15. කොන්ත්‍රාත්කරුවන් .
16. කොමිස් ඒජන්තවරු .
17. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
18. පුද්ගලික ගණන් පරීක්ෂකවරුන්.
19. ගණකාධිකාරීවරුන්.
20. වාණිජ සිත්තරුන්.
21. ගෘහ නිර්මාණ ශිල්පීන්.
22. පින්තාරුකරුවන්/මෝස්තර සකස්කරන්නන්.
23. උපදේශක ආයතනයන්.
24. සැලසුම්කරුවන්.
25. පුද්ගලික මිනින්දෝරුවන්.
26. රක්ෂණ නියෝජිත ආයතන.
27. ප්‍රවාහන නියෝජිතයන්.
28. පුද්ගලික ප්‍රවාහන අයිතිකරුවන්.
29. කුලී වාහන අයිතිකරුවන්.
30. පුද්ගලික තක්සේරුකරුවන්.
31. රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම.
32. වාණිජ බැංකු සේවා සපයන මූල්‍ය ආයතනයන්.
33. පුද්ගලික දේපළ වෙළඳාම් ආයතන.
34. සියලුම මූල්‍ය ආයතනයන්.
35. ලොතරැයි නියෝජිතයින්.
36. පුද්ගලික ඉංජිනේරුවන්.
37. භාෂා පරිවර්තනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

*02 වැනි උපලේඛනය*

| | *I වැනි තීරුව*<br>*බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයනේ ලත් ලැබීම් ප්‍රමාණය* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 5. | රු. 75,000. ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200.0 |
| 6. | රු. 1,50,000. ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

09-616/2

## කුරුණෑගල මහ නගර සභාව

### 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කුරුණෑගල මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම.ස. 5(1) දරන අංක යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2016 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අනුරාධ ගාමිණී පෙරමුණගේ,
නගරාධිපති,
කුරුණෑගල මහ නගර සභාව.

2015 අගෝස්තු මස 28 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

"252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 247අ සහ ආ වන වගන්තිවලින් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නාවූ හෝ ව්‍යාපාර විෂය බද්දට අදාල නොවන්නාවූ වෙනත් ඕනෑම කර්මාන්තයක් කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී කර ගන යනු ලබන අවස්ථාවක එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී කර්මාන්ත බද්ද 2016 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට කුරුණෑගල මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා යෝජනා කරන්නේ ය.".

#### උපලේඛනය

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | *වාර්ෂික වටිනාකම* | *බලපත්‍ර ගාස්තුව* *රු. ශත* |
| 01. | රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 1,000 0 |
| 02. | රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට | 2,000 0 |
| 03. | රු. 2,500 ඉක්මවන විට | 3,000 0 |

09-616/3

---

## මැදදුම්බර ප්‍රාදේශීය සභාව

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ මැයි මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. එම්. සී. බී. ඒකනායක,
ලේකම්,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 31 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

**1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත**

"1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 1988 අගෝස්තු 23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා වූ අතුරු ව්‍යවස්ථාවල අංක 1 දරන කොටස සහ අංක 2 දරන කොටසේ 1 සිට 42 දක්වා වූ කාණ්ඩයන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 "අ" වගන්තිය සමග කියවිය යුතු 122 සහ 126 වැනි වගන්ති අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදළ වන අයුරු මෙම අතුරු ව්‍යවස්ථාවල ඉහත කී 2 වැනි වගන්තියේ 3 වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට 1991.09.27 වැනි දින පැවැති මැදදුම්බර ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අනුමත කර ඇති බව මෙයින් දන්වමි.

ජී. ආර්. එස්. පී. ගමගේ ජයරත්න,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

09-516

---

## කුරුණෑගල මහ නගර සභාව

### 2016 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද පැනවීම සඳහා

කුරුණෑගල මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම.ස. 5(2) දරන අංක යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2016 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත පනවන ලද බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අනුරාධ ගාමිණී පෙරමුණගේ,
නගරාධිපති,
කුරුණෑගල මහ නගර සභාව.

2015 අගෝස්තු මස 28 වැනි දින,
කුරුණෑගල මහ නගර සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247ඇ වැනි වගන්තිය අනුව මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසුවන විටක (කඹුරු ඉඩම් හැර) හෝ යුක්තිසහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටෙක එවැනි යම් ඉඩමක,

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

*(ආ)* ඒ ඉඩම (කුඹුරු ඉඩම් හැර) විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1:20 (එකට දෙක) වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2013 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් 0.5%ක (සියයට දශම පහක) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2016 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් කුරුණෑගල මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා යෝජනා කරන්නේය.”.

09-615

---

## මහරගම නගර සභාව

නගර සභා ආඥපනත යටතේ (255 වැනි අධිකාරය) 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥපනතේ 255 වැනි අධිකාරයේ 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම් හා සභාවේ බලතල, කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරී,
මහරගම නගර සභාව.

2015 සැප්තැම්බර් මස 04 වැනි දින,

උපලේඛනය

| *අනු. අංකය* | *සැලසුම් අංකය හා දිනය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *උපලේඛනය අනුව සීමාවන්* |
|---|---|---|---|---|---|
| 01 | සැලසුම් අංකය 7/85<br>දිනය : 1985.11.30 | මහරගම පමුණුව පාර මාරගහලන්ද පෙදෙස මාර්ගය | අඩි 335 | අඩි 10 | *උතුරට* : ව. අ. 103/2B මාරගහලන්ද එල්. තිලකරත්න මහතාගේ ඉඩම සහ ව.අ. 103/2A ලියනරත්න මහතාගේ ඉඩම සහ ව.අ.103/1 මාරගහලන්ද ඉඩම සහ ව. අ. 103 මාරගහලන්ද බෝදරගම යන අයගේ ඉඩම,<br><br>*දකුණට* : කැබලි අංක 6 ද, කැබලි අංක 5 ද, කැබලි අංක 4 ද, කැබලි අංක 1 සහ 2 සහ කැබලි අංක 3 යන ඉඩම,<br><br>*නැගෙනහිරට* : පමුණුව පාර<br><br>*බටහිරට* : ව. අ. 103/3 සම්පත් අල්විස් යන අයගේ ඉඩම, |
| 02 | සැලසුම් අංකයඃ 4641<br>දිනය : 2006.05.27 | මහරගම පන්සල පාර අංක159/12/ඒ සිට 159/12ඊ දක්වා නිවෙස් පිහිටි අතුරු මාර්ගය | අඩි 170 | අඩි 10 | *උතුරට* : ඉඩම් කැබලි අංක A6 ද ඉඩම් කැබලි අංක A7 ද ඉඩම් කැබලි අංක A8 සහ ඉඩම් කැබලි අංක<br><br>*දකුණට* : දකුණු පැත්තේ ප්‍රදේශවාසීන් ප්‍රවේශය ලබන්නේ නැත,<br><br>*බටහිරට* : ඉඩම් කැබලි අංක ඒ6,<br><br>*නැගෙනහිරට* : පන්සල පාර |

1

09-569

### අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පල කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. චන්ද්‍රාවතී,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2015 සැප්තැම්බර් මස 08 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*මාර්ගයේ නම* :- කෙහෙල්වත්ත බෙලිගස්වත්ත මාර්ගය
*මාර්ගයේ ආරම්භය සහ අවසානය* :- බෙලිගස්වත්ත කෝවිලවත්ත සිට ඉහළවත්ත දක්වා මාර්ගය
*ග්‍රාමසේවා වසම හා අංකය* :- 48, කෙහෙල්වත්ත
*මාර්ගයේ දිග හා පළල* :- දිග මීටර් 165, පළල අඩි 08

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. ඩබ්. පුංචිනෝනා මිය සහ
    එම්. ආර්. පුංචිමහත්තයා මයා - කෝවිලවත්ත නොහොත් බෙලිගස්වත්ත ඉඩම
02. එම්. පී. සූරසේන මයා සහ එම්. ජී. සූරසේන මයා - ඉහලවත්ත
03. එම්. පී. රසික මයා - ඉහලවත්ත

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. ඩබ්. පුංචිනෝනා මිය සහ
    එම්. ආර්. පුංචිමහත්තයා මයා - කෝවිලවත්ත නොහොත් බෙලිගස්වත්ත ඉඩම
02. එම්. පී. සූරසේන මහා සහ එම්. ජී. සූරසේන මයා - ඉහලවත්ත
03. පී. කේ. කරුණාතිස්ස මයා - ඉහලවත්ත
04. එම්. පී. සෝමරත්න මයා - ඉහලවත්ත
05. එන්. උදය කුමාර මයා - ඉහලවත්ත

*මාර්ගයේ නම* :- ගල්අතර රයිගොඩවත්ත මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය* :- රයිගොඩවත්ත කපිල මහතාගේ නිවස අසල සිට ප්‍රියානි කුමාරි ජයසිංහගේ නිවස දක්වා මාර්ගය

*ග්‍රාමසේවා වසම හා අංකය* :- 15C ගල්අතර
*මාර්ගයේ දිග හා පළල* :- දිග මීටර් 114, පළල අඩි 08

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. එම්. ගාමිණී වසන්ත කුමාර මයා - ඉහලගලේහේන ඉඩම
02. බණ්ඩාර මැණිකේ මිය - ඉහලගලේහේන ඉඩම
03. ඩබ්. ඩී. නිහාල් ප්‍රේමරත්න මයා - ඉහලගලේහේන ඉඩම
04. ජේ. ගාමිණී මයා - ඉහලගලේහේන ඉඩම

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. වී. පී. කපිල කුමාර මයා - ඉහලගලේහේන ඉඩම
02. එම්.පී.පියසේන මයා සහ එම්. ලලිතා පත්මිණී මිය - රයිගොඩවත්ත ඉඩම
03. ජේ. ජී. ප්‍රියානි කුමාරි මිය - ඉහලගලේහේන ඉඩම
04. ඩබ්. ඩී. නිහාල් ප්‍රේමරත්න මයා - ඉහලගලේහේන ඉඩම

*මාර්ගයේ නම* :- පරපිටිය ජනපද අතුරු මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය* :- පරපිටිය ජනපද නැසීගිය රංජිත් සමරසිංහ මහතාගේ නිවස අසලින් ආරම්භව හයවන නිවස වන එච්. පී. ආරියරත්න මහතාගේ නිවස දක්වා මාර්ගය

*ග්‍රාමසේවා වසම හා අංකය* :- 47A දෙබත්ගම පල්ලේබාගේ
*මාර්ගයේ දිග හා පළල* :- දිග මීටර් 125, පළල අඩි 08

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. ඩබ්ලිව්. කේ. දයාරත්න මයා - බඩල්තැන්නමූකලාන ඉඩම
02. ජී. ඩී. විජේසේකර මයා - බඩල්තැන්නමූකලාන ඉඩම.

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

01. එස්. පී. සේදරා මයා - බඩල්තැන්නමූකලාන ඉඩම
02. ජී. ඩී. විජේසේකර මයා - බඩල්තැන්නමූකලාන ඉඩම

09-633

---

### මොරටුව මහ නගර සභාව

පරිපූරක අයවැය ලේඛනය 2015 - අංක 2

මහ නගර සභා ආඥාපනතේ 214.2(ආ) වගන්තිය ප්‍රකාරව 2015 මුදල් වර්ෂය සඳහා වූ මොරටුව මහ නගර සභාවේ පරිපූරක අයවැය ලේඛනය අංක 2, 2015 සැප්තැම්බර් මස 16 වැනි දින සිට දින හතක (07) කාලයක් මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා මොරටුව මහ නගර සභාවේ නගරාධිපති ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු වන මා විසින් පහත සඳහන් ස්ථානවල තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස් කාර්යාලය - මොරටුව
ජනසෙත මහජන පුස්තකාලය - කටුබැද්ද

ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු,
නගරාධිපති,
මොරටුව මහ නගර සභාව.

2015 සැප්තැම්බර් මස 11 වැනි දින,
මොරටුව මහ නගර සභා කාර්යාලයේ දී ය.

09-646

**වඩමාරච්චි දකුණ/බටහිර ප්‍රාදේශීය සභාව කරවෙඩ්ඩි**

1975 අංක 17 දරන පනතේ කමිටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනය

පහත ශීර්ෂයේ සඳහන් කර ඇති පුද්ගලයින්ගේ ඉඩමේ ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කමිටුව 2016 වර්ෂයේ පවත්වාගෙන යාමට ඉහත අයිතිය ලබාදෙන පනතේ 06 වැනි වගන්තියට අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

මෙම අයිතිය ලබාදීමට යෝජනා කර ඇති කමිටුව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළ කරයි නම් ගැසට් නිවේදනය පළ කර ඇති දින සිට සති හතරක් ඉක්ම යාමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *කමිටුවේ සභාපති ද ලේකම්, කළමනාකරු ද යන වග* | *කමිටුවේ නම* | *කමිටුව පවත්වාගෙන යාමට සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| අය්යාතුරෙයි විග්නේෂ්වරන් අයිංකරාපදි තෙවරයාලි නෙල්ලිඅඩි | කළමනාකරු | අයිංගරන් විනෝදාංශ සමාජය | ප්‍රධාන වීදිය, නෙල්ලිඅඩි, කරවෙඩ්ඩි |

ක. කනකදුරෙයි,
ලේකම්.

2015 සැප්තැම්බර් මස 03 වැනි දින,
කරවෙඩ්ඩි,
වඩමාරච්චි දකුණ බටහිර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-618

---

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියට අනුව මාර්ග නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. 1975 හි අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනතේ විධිවිධාන පරිදි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාර්ගය සඳහා මාර්ග නාමය ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් දන්වමි.

කුසුමා රංජනී වැලිකඩ,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 28 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**මාර්ග ලේඛනය**

| *පැරණි මාර්ග නාමය* | *භාවිතා කළ යුතු නාමය* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* |
|---|---|---|---|
| දාපිළිගොඩ විහාරගම මාර්ගය | සිසිර කුමාර මාවත | දාපිළිගොඩ ස.ණ.ස. ගොඩනැගිල්ල ඉදිරිපිට | දාපිළිගොඩ පන්සල මාර්ගය |

09-494

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.